# අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව

## 2015 වර්ෂයේ විගණන හා විමර්ශන කටයුතු සම්බන්ධ ප්‍රගති සමාලෝචන සාකච්ඡාව

# මෙහෙවර

උඅව පළාත් ජනතාවගේ උන්නතිය සඳහා පළාත් රාජ්‍ය සේවයේ දායකත්වය සහ සම්පත් යෙදවීම් අපේක්ෂිත අරමුණු සහ ඉලක්ක කෙරෙහි ළඟා වීම සම්බන්ධ මූලාය පාලනය පිළිබඳ ඉහළ කළමනාකරණයට අවශ්‍ය තීරණ ගැනීම වෙනුවෙන් නිරීක්ෂණ,නිර්දේශ හා යෝජනා ඉදිරිපත් කිරීම.

# දැක්ම

"සකසුරුවම් භාවය හා නීතිමය තත්ත්වය"

අභ්‍යන්තර විගණන කටයුතු වලදී ඌව පළාතේ ප්‍රධාන ලේකම්තුමාගේ උපදෙස් හා සහාය නිරතුරුවම ලබා දුන් අතර පළාත් සභාවේ සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු අනෙකුත් නිලධාරීන් ලබා දුන් නොමද සහයෝගය මත පසුගිය වර්ෂ කිහිපය මුළුල්ලේම ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට හැකියාව ලැබුණි.

එම විගණන විමසුම් ප්‍රමාණය පහත සඳහන් පරිදි ඉදිරිපත් කරමි.

| | |
|---|---|
| 2015 වර්ෂයේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කළ විගණන වාර්තා සංඛ්‍යාව | 147 |
| නිකුත් කළ විශේෂ විමර්ශන වාර්තා සංඛ්‍යාව | 31 |
| එකතුව | 178 |

| 2011 | 2012 | 2013 | 2014 | 2015 | එකතුව |
|---|---|---|---|---|---|
| 107 | 145 | 177 | 225 | 178 | 832 |

ඌව පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරනු ලබන විගණන හා විමර්ශන වාර්තා මඟින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ යෝජනා හා මඟපෙන්වීම් සම්බන්ධයෙන් ඌව පළාත් සභාවේ ප්‍රධාන ලේකම් තුමා ඇතුළු සියළුම ලේකම්වරු, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු හා දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන්ගේ විශේෂ අවධානය යොමු වීමත් විගණන හා කළමනාකරණ කමිටු වල ක්‍රියාකාරීත්වයට දැක්වූ ප්‍රමුඛ දායකත්වයත් හේතුවෙන් රාජ්‍ය විගණනය මඟින් සිදු කළ පරීක්ෂා කිරීම් වලදී විශාල වශයෙන් අඩුපාඩු හෝ අක්‍රමිකතා මතු නොවුණි.එම හේතුව මත **2014** වසරේ යහපත් විගණන මතයන් සමස්ත ඌව පළාත් සභා ගිණුම් සම්බන්ධයෙන් ලැබී ඇත.

# 2.1 විගණන මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම, හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

# 2014 විගණන මතයට බලපෑමක් සිදු කර ඇති 2.2 ඡේදයේ කරුණු පිළිබඳව අවධානය යොමු කිරිම

## 01. ඉදිරිපත් නොකළ ගිණුම්

| ඉදිරිපත් නොකළ ගිණුම් | ගිණුම් ඉදිරිපත් කිරීමේ වගකීම | හේතු සහ වර්තමාන තත්වය |
|---|---|---|
| 1. විසර්ජන ගිණුම් | 01.නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)<br>02. සමාජ සේවා දෙපාර්තමේන්තුව | ලිපි භාරදීමේදී දින 01ක ප්‍රමාදයකි. |
| 2. පළාත් සභා නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම් | 01. අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 2014 ගිණුම විගණනය වෙත ඉදිරිපත් කර ඇත. 2015.06.15 දින ගිණුම් ඉදිරිපත් කර ඇත. |
| | 02. ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | 2015.03.16 දින ගිණුම් ඉදිරිපත්කර ඇත. |
| 3. වාණිජ අත්තිකාරම් ගිණුම් | 01. පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලය | 2015.04.02 ඉදිරිපත් කර ඇත. |
| | 02. ඔක්කම්පිටිය බීජ ගොවිපල | 2015.05.15 ගිණුම ඉදිරිපත් කර ඇත. |
| | 03. පේෂකර්ම අත්තිකාරම් ගිණුම | 2015.05.28 දින ගිණුම් ඉදිරිපත් කර ඇත. |

| අරමුදල් ගිණුම | ආයතනය | වර්තමාන තත්ත්වය |
| --- | --- | --- |
| ඌව නවෝද්‍යා අරමුදල 10 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පිරිස් හා පුහුණු) | ගිණුම් සකස් කර අවසන්අතර විගණනය විසින් නවතම ආකෘති අනුව ඉදිරිපත් කරන ලෙස දන්වා ඇති හෙයින් එම කටයුතු මේ වන විට සම්පූර්ණ කරමින් පවතී |
| හින්දු සංස්කෘතික අරමුදල 04 | මුදල් හා ක්‍රම සම්පාදන,නිතිය හා සාමය,අධ්‍යාපන,පළාත් පාලන,විදුලිබල හා බලශක්ති,ඉදිකිරීම්,ග්‍රාමිය යටිතල පහසුකම් අමාත්‍යාංශය | 2011,2012,2013 වර්ෂ වල ගිණුම් නියමිත දින වකවානු වලදී විගණනය වෙත ඉදිරිපත් කර ඇත. 2015 වර්ෂයේ ගිණුම පමණක් ප්‍රමාද වීමකින් 2015.12.15 දින ඉදිරිපත් කර ඇත. |
| සමාජ සුභසාධන සහ පුනරුත්තාපන අරමුදල 14 | සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය,පරිවාස හා ළමාරක්ෂක, වනිතා කටයුතු හා සමාජ සුභසාධන අමාත්‍යාංශය | අක්‍රීය ගිණුමකි.ගිණුම වසා මුදල් පළාත් සභා පොදු අරමුදලට බැර කර ඇත. |
| ඌව පළාත් සංචාරක අරමුදල 01 | කෘෂිකර්ම, වාරිමාර්ග,සත්ත්ව නිශ්පාදන සහ මිරිදිය ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | ප්‍රඥාප්තියක් අනුමත නොවී ඇති බැවින් සහ කිසිඳු වියදමක් කර නොමැති බැවින් අදාළ මුදල් ක්‍රීඩා අමාත්‍යාංශය වෙත ලබා දි ඇත. |
| ප්‍රඥාප්ති ගිණුම<br>ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන 01<br><br>ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලය01 | මුදල් හා ක්‍රම සම්පාදන,නිතිය හා සාමය,අධ්‍යාපන,පළාත් පාලන,විදුලිබල හා බලශක්ති,ඉදිකිරීම්,ග්‍රාමිය යටිතල පහසුකම් අමාත්‍යාංශය | නියමිත ආකෘතියෙන් හා පිළිගත් ගිණුම් ප්‍රතිපත්ති හා මූලධර්මයන්ට අනුකූලව ගිණුම් ඉදිරිපත් කර නොමැති නිසා අදාළ ගිණුම් විගණනය විසින් ආපසු එවා ඇත. මේ වන විට අදාළ නිවැරදිකිරීම් සිදු කරමින් පවතී. |

# විගණනය සඳහා සාක්ෂි ඉදිරිපත් නොකිරීම

| ආයතනය | විස්තරය | වර්තමාන තත්ත්වය |
|---|---|---|
| ක්‍රීඩා අමාත්‍යාංශය | රු.1348900.00 ක වටිනාකමක් ඇති ප්ලාස්ටික් පුටු 79ක් , ටෙන්ට් 32ක්,ජල ටැංකි 35 ක් ප්‍රතිලාභීන් වෙත ලබාදුන් විස්තර නොතිබීම. | ප්‍රතිලාභී නාමලේඛන සම්පූර්ණ කර විගණනය වෙත ඉදිරිපත් කර ඇත. |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | ඔක්කම්පිටිය බීජ ගොවිපල සතු කැබ් රථ වල රු.37779.00ක ඉන්ධන ලබාගැනීමට අදාළ ධාවය සටහන් ඉදිරිපත් නොකිරීම. | දෙපාර්තමේන්තු පරීක්ෂණයක් සිදු කර ධාවන සටහන් වලට ඇතුළත් කර නොමැති ඉන්ධන වටිනාකම රියදුරුගෙන් අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. |

# 02.හිඟ ආදායම්

| ආදායම් වර්ග | අදාළ ආයතනය | වටිනාකම | වර්තමාන තත්වය |
|---|---|---|---|
| ඉඩම් බදු | ප්‍රාදේශීය ලේකම් කාර්යාල/ඉඩම් කොමසාර්ස් දෙපාර්තමේන්තුව | 10,691,272.00 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සමස්ත විගණනයක් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මඟින්ද සිදු කර ඇත.එම විගණනයේදී සමස්ත හිඟ ආදායම් දළ වශයෙන් ලක්ෂ 500ක් පමණ වේ.<br>මෙම හිඟ ආදායම තුළ බදුකර නොගෙවා රජයේ ඉඩම් බුක්ති විඳින නොයෙකුත් හේතූන් මත අදාළ බදු මුදල විධිමත්ව තක්සේරු කර නොමැති සහ බලපත්‍ර ලබා නොදී ඇති ඉඩම්ද ඇතුළත් වී ඇත. |
| සුරා බදු බලපත්‍ර | ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 1,238,300.00 | මේ වන විට මුදල් අය වෙමින් පවතී. |
| හිඟ වාහන කුලී සහ සේවා ගාස්තු | පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලය | 38,098,072.00 | අදාළ හිඟ මුදල් සම්බන්ධයෙන් ලේඛන සහ සේවා ගාස්තු විධිමත් කර ගැනීමත් සත්‍ය වශයෙන්ම ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. මේ වන විට වර්තමාන හිඟය රු.14002145.00 වේ. |

මෙම තත්ත්වය මත 2015 වර්ෂයේ පළාත් සභා සමස්ත ගිණුම් විධිමත් හා අංගසම්පූර්ණව ඉදිරිපත් කිරීමේ හැකියාව පවතී. මේ නිසා 2015 වර්ෂයට අදාළ ගිණුම් සම්බන්ධයෙන් යහපත් විගණන මතයක් ලබා ගැනීමට පළාත් සභා සියළුම නිලධාරීන්ගේ මැදිහත්වීම, සහයෝගය ලැබී ඇති බව අභ්‍යන්තර විගණනයේ නිරීක්ෂණයයි.

# 2015 වර්ෂයේ විගණන විමසුම් ඉදිරිපත් කිරීම

| අමාත්‍යාංශය | නිකුත් කළ විගනන විමසුම් සංඛ්‍යාව | පිළිතුරු ලැබුණු සංඛ්‍යාව | පිළිතුරු සඳහා එකඟ වූ සංඛ්‍යාව | පිළිතුරු නොලැබුණු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ඌව පළාත් මුදල් හා ක්‍රම සම්පාදන,නීතිය හා සාමය,අධ්‍යාපන,පළාත් පාලන,විදුලිබල හා බලශක්ති,ඉදිකිරීම්,ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍යාංශය | 82 | 53 | 41 | 29 |
| ඌව පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු,සංචාරක,ප්‍රවාහන,සංස්කෘතික,පේෂකර්ම අමාත්‍යාංශය | 04 | 02 | 02 | 02 |
| ඌව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය,පරිවාස හා ළමාරක්ෂක, වනිතා කටයුතු හා සමාජ සුභසාධන අමාත්‍යාංශය | 25 | 19 | 14 | 06 |
| ඌව පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග,සත්ත්ව නිශ්පාදන සහ මිරිදිය ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | 07 | 03 | 02 | 04 |
| ඌව පළාත් මාර්ග සංවර්ධන,නිවාස,ජල සම්පාදන,වතු යටිතල පහසුකම් හා සමූපකාර කටයුතු අමාත්‍යාංශය | 05 | 05 | 04 | - |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 53 | 20 | 16 | 33 |
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය | 02 | 01 | 01 | 01 |
| එකතුව | 178 | 103 | 80 | 75 |

# ඉහත පරිදි අභ්‍යන්තර විගණන කටයුතු සිදු කර වාර්තා කිරීමෙන් පසු නිවැරදි කරගත් වැදගත් ක්ෂේත්‍රයන් කිහිපයක් පහත ඉදිරිපත් කරමි.

**01.** ඌව ව්‍යවසායකත්ව අරමුදල (නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) දෙපාර්තමේන්තුව වර්ෂ 10කට ආසන්න කාලයක් අක්‍රීය මට්ටමින් තිබූ මෙම අරමුදලේ කිසිඳු මුදල් ශේෂයක් නොමැති බවට බැංකු මගින් කරුණු ඉදිරිපත් විය. එසේම වර්ෂ 10කට ආසන්න කාලයක ගිණුම්ද විගණනය වෙත ඉදිරිපත් කිරීමට අපහසු වි රාජ්‍ය ගිණුම් කාරක සභා මට්ටම දක්වා කරුණු ඉදිරිපත් කිරීමට සිදු විය.

## ඌව ව්‍යවසායකත්ව සංවර්ධන අරමුදල සම්බන්ධයෙන් සිදු කරන ලද විශේෂ අභ්‍යන්තර විගණන පරීක්ෂණය

ප්‍රදේශ පාදක සම සංවර්ධන ව්‍යාපෘතිය (ABGEP) යටතේ ලබා දුන් මුදල් හා ඌව පළාත් සභාව විසින් ලබා දුන් මුදල ප්‍රාග්ධනය ලෙස යොදවා ආරම්භ කර විවිධ හේතූන් මත වර්ෂ 10කට ආසන්න කාලයන් අක්‍රීයව පැවති ඌව ව්‍යවසායකත්ය සංවර්ධන අරමුදල සම්බන්ධයෙන් විශේෂ පරීක්ෂණයක් සිදු කර බැංකු ගිණුම් වල රඳවා තිබූ රු.26,353,992.75 මුදලක් අනාවරණය කර දීමට හැකි විය. වර්තමානය වන විට එම මුදලින් 25,589,933.33 ක මුදලක් අය කර ගැනීමට හැකියාව ලැබී ඇත.මේ වන විට මෙම අරමුදල නැවත සක්‍රීය කිරීමට අවශ්‍ය මූලික කටයුතු සකස් කර ඇති අතර අරමුදලේ රැස්වීම් වාර කිහිපයක්ද පවත්වා ඇති අතර වර්තමාන පරිපාලනය මේ සම්බන්ධයෙන් වැඩසටහන් සැලසුම් කරමින් පවතී.

2005 වර්ෂය සිට වර්ෂ නවයකට අදාළව සකස් කිරීමට නොහැකිව තිබූ අරමුදලේ ගිණුම් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මගින් සකස් කර විගණනය වෙත ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලදී.

**02. . උපමාන පාදක යෝජනා යටතේ අත්තිකාරම් පියවීම සම්බන්ධ විශේෂ විගණන පරීක්ෂණය**

උපමාන පාදක වැඩසටහන් යටතේ අත්තිකාරම් පියවීම් සම්බන්ධ අභ්‍යන්තර විගණන නිලධාරින් යොදවා අත්තිකාරම් පියවීමට අදාළ ලේඛන, සාක්ෂි හඳුනාගෙන ඉදිරිපත් කරමින් විගණන හා කළමනාකරණ කමිටු වලදී අඛණ්ඩ සමාලෝචනයට භාජනය කිරීම තුළින් ඌව පළාත් සභාවේ මූල්‍ය කටයුතු සම්බන්ධ මුහුණ පා ඇති අර්බුධකාරී තත්ත්වයට පිළියම් ලබා දීමට හැකියාව ලැබුණි. උදාහරණයක් ලෙස 2014.12.31 දිනට පියවීමට තිබූ රු.කෝටි 07 ක මුදලින් 2015.12.31 දින වන විට රු.කොටි 06 දක්වා අඩු කර ගැනීමට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර ඇත. මෙම තත්ත්වය නිරන්තරයෙන්ම විගණන හා කළමනාකරණ කමිටු වල සාකච්ඡා කර සහයද ලබා ගන්නා ලදී.

**උදා.01. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පවරා ඇති පළාත් සභා කටයුතු පිළිබඳ පරීක්ෂාව.**

**2015 වර්ෂය බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්කවලට අයත් සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් හා බලපත්‍ර ආදායම් සම්බන්ධයෙන් විගණනයන් සිදුකර නිරීක්ෂණ නිර්දේශ හා අවශ්‍ය උපදෙස් විගණන වාර්තා මඟින් ඉදිරිපත් කිරීම.**

# ප්‍රාදේශීය ලේකම් කාර්යාල

ඌව පළාත් සභාවේ වාර්ෂික මුදල් ප්‍රකාශය අනුව පළාත් සභා අරමුදලට සැලකිය යුතු ආදායමක්, පළාත් සභාව සතු හා පළාත් සභාවට පවරා ගත් ඉඩම් සම්බන්ධයෙන් ඇස්තමේන්තු ගත කෙරේ.

මෙහිදී රජය සතු ඉඩම් නිවැරදිව හඳුනා ගැනීමත් වටිනාකම තක්සේරු කර ගැනීමටත්, ඉඩම් රාජකාරි පැවරී ඇති නිලධාරීන්ගේ කාර්ය සාධනයත්, හිඟ බදු මුදල් අය කර ගැනීමත්, මුල් කර ගනිමින් පළාත් සභා අරමුදලට ලැබිය යුතු නිවැරදි දායකත්වය තක්සේරු කිරීමත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පැවරී ඇති වාහන බලපත්‍ර ආදායම් එකතු කිරීමේ කාර්ය භාරයක් පදනම් කර ගනිමින් පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධයෙන් විගණන පරීක්ෂණයක් සිදු කරන ලදි. මෙහිදී විශේෂ අවධානයක් යොමු වූ වැඩි වටිනාකමින් යුත් බදු අය විය යුතු ක්ෂේත්‍රයන් කිහිපයක් පහත පරිදිය.

# ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මහියංගණය

විගණන වාර්තාවේ අංකය - අවි/30/2015/05/07 දිනය - 2015.09.02

## දීර්ඝ කාලීන ඉඩම් බදුදීම

මහියංගණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීර්ඝ කාලීන ඉඩම් බදුදීමේ ලිපිගොනු හා බදු අය කිරීමේ ලේඛන පරීක්ෂා කිරීමේදී පහත තත්ත්වයන් විගණනයට නිරීක්ෂණය වී ඇත.

මහියංගණ නගරයේ මහවැලි සිනමා නමින් පවත්වාගෙන යන හෙක්ටෙයාර් **0.2032** ක ප්‍රමාණයක ඉඩම සහිත දෙමහල් ගොඩනැගිල්ලට අදාල රු.**345840.00** මුදලක් අය වීමට ඇති බව ලේඛන අනුව නිරීක්ෂණය විය.

# <u>දීර්ඝ කාලීන ඉඩම් බදුදීම</u>

**මහියංගණ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ දීර්ඝ කාලීන ඉඩම් බදුදීමේ ලිපි ගොනු හා බදු අය කිරිමේ ලේඛන පරීක්ෂා කිරීමේදී පහත තත්ත්වයන් විගණනයට නිරීක්ෂණය වී ඇත.**

**මහියංගණ නගරයේ මහවැලි සිනමා නමින් පවත්වාගෙන යන හෙක්ටෙයාර් 0.2032 ක ප්‍රමාණයක ඉඩම සහිත දෙමහල් ගොඩනැගිල්ලට අදාල රු.345840.00 මුදලක් අය වීමට ඇති බව ලේඛන අනුව නිරීක්ෂණය විය.**



මහියංගණ නගරයේ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයක හෙක්ටෙයාර් **0.0470** ක ඉඩම සහිත ගොඩනැගිල්ලට අදාළව රු.**2345250.00** ක මුදලක් අය වීමට ඇත.



මහියංගණ නගරයේ පිහිටි පහත වාණිජ ආයතන හා සේවා මධ්‍යස්ථාන වලින් සැලකිය යුතු හිඟ බදු මුදල් අය නොවී පවතින තත්ත්වයන් නිරීක්ෂණය විය.

හෙක්ටෙයාර් **0.0625** ක භූමි ප්‍රමාණයක පවත්වාගෙන යන වාහන සේවා මධ්‍යස්ථානයකි. හිඟ මුදල රු.**74925.00** කි.







**හෙක්ටෙයාර් 0.0040 ක ඉඩම් ප්‍රමාණයක වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. 2013 හා 2014 වර්ෂ වල හිඟ බදු ආදායම් ලෙස රු.113600 කි.**



මෙම තත්ත්වයන් පිළිබඳව විගණන වාර්තා වලින් හෙළිදරව් කිරීමෙන් අනතුරුව පළාත් සභාවට ලැබිය යුතු ඉඩම් ආදායම් නිවැරදිව තක්සේරු කිරීම, අය කිරීමේ ක්‍රමවේදයන් වැඩි දියුණු කිරීම, රාජකාරීන් පැවරී ඇති නිලධාරීන්ගේ කාර්ය සාධනය පිළිබඳවද පළාත් ඉඩම් කොමසාරිස්වරයා ඉඩම් නිලධාරීන් සම්බන්ධ කරගනිමින් විගණන හා කළමනාකරණ කමිටු වලදී දීර්ඝ වශයෙන් සමාලෝචනයට භාජනය කරන ලදී.


ඉහත නම් සඳහන් ආර්.එම්.බණ්ඩාර මැණිකා යන අය මියගොස් ඇති අතර ඇගේ
අවලංගු කර ඇත. එමෙන්ම සිමියොන් පොන්සේකා යන අයට ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ
බලපත්‍රයක් නිකුත් කර ඇති බැවින් 2014 වර්ෂයේ සිට බදු අය නොවිය.

තවද අදාල විගණන විමසුම මගින් පෙන්වා දී ඇති අඩුපාඩු හා ක්‍රමදෝශයන් නිවැරදි කිරිමට හා ඉදිරියේදී එවැනි තත්ත්වයන් ඇති නොවීමට අවශ්‍ය පියවර ගෙන ඇති බවත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ඩී.එම්.එල්.එච්.දිසානායක,
ප්‍රාදේශිය ලේකම්,
[illegible]ල.

පිටපත් :
1. ප්‍රධාන ලේකම්,ප්‍රධාන ලේකම් කාර්යාලය, ඌව පළාත් සභාව ,බදුල්ල - කාරුණික දැ.ගැ.පි
2. ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්තුමා,ආණ්ඩුකාරවර කාර්යාලය,බදුල්ල - කාරුණික දැ.ගැ.පි
3. පළාත් ඉඩම් කොමසාරිස් , පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය , බදුල්ල - කාරුණික දැ.ගැ.පි

18 01 2016

මේ අනුව විගණන වාර්තා නිකුත් කිරීමෙන් පසු විශේෂ ප්‍රගති සමාලෝචන කිහිපයක් පවත්වා ඇති අතර ප්‍රාදේශීය ලේකම් වරුන් සමඟ සාකච්ඡා සිදු කර ඇත. මේ සම්බන්ධයෙන් විගණන හා කළමනාකරණ කමිටු කිහිපයකදීම යම් යම් තීරණයන්ට එළඹ ඇත. මෙහි ප්‍රතිඵලයන් වශයෙන් පහත සඳහන් හිඟ ආදායම් ප්‍රමාණයක් අය කර ගැනීමට හැකියාව ලැබී ඇත.

උදා:-

| | | |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කතරගම | 2015.10.26 | රු. 589,667.00 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - හාලිඇල | 2015.12.16 | රු. 350,000.00 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - හපුතලේ | 2015.08.11 | රු. 655,623.00 |

# විගණන හා කළමනාකරණ කමිටු කාර්ය භාරය

ඌව පළාත් සභාවට අයත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීම හා පවත්වාගෙන යාමේ කාර්ය භාරය ඌව පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව වෙත පැවරේ.

ඌව පළාතේ අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂවරයා විගණන හා කළමනාකරණ කමිටු කැඳවුම්කරු වේ. භාණ්ඩාගාර චක්‍රලේඛ, රාජ්‍ය මුදල් චක්‍රලේඛ හා අභ්‍යන්තර මුදල් චක්‍රලේඛ මඟින් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව වෙත, විගණන හා කළමනාකරණ කමිටු සම්බන්ධයෙන් උපදෙස්, මඟපෙන්වීම් හා බලය පැවරේ.

- රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක PN/PE/P/7 හා 2000.03.15 දින
- 2000.06.12 දිනැති IAI/2000/1 භාණ්ඩාගාර චක්‍රලේඛ
- ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ 2002.08.23 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛය
- ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ අංක10/2010 හා 2010.07.27 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛය
- ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්ගේ අංක 1/7/3/1 හා 2012.02.13 දිනැති උපදෙස් ලිපිය
- ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ අංක 4/ආ/1/7 හා 2012.08.22 දිනැති අංක 4/2012 දරණ චක්‍රලේඛය

- ඌව පළාත් සභාවට අයත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන ආවරණය වන පරිදි, විගණන කමිටු පිහිටුවීමේ කාර්ය භාරය, 2015 වර්ෂය තුලදී අවසන් කිරීමට අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවට හැකියාව ලැබුණි.

විගණන හා කළමනාකරණ කමිටු වල කාර්ය භාරය සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සඳහා, සහකාර විගණකාධිපති (ඌව) සම්බන්ධ කර ගනිමින් වැඩමුළුවක් මෙන්ම විගණන හා කළමනාකරණ කමිටු හා සම්බන්ධ වන සියළුම නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් පළාත් සභාවට අයත් සියළුම ආයතන ආවරණය වන පරිදි 2015 වර්ෂයේදී පැල්ගහතැන්න පුහුණු ආයතනයේදී වැඩමුළු කිහිපයක්ද ඌව පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මඟින් වපත්වන ලදි.

විගණන හා කළමනාකරණ කමිටුවල සංයුතිය පහත පරිදි වේ.

සභාපති - අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා
කැඳවුම්කරු - අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ/නියෝජිතයකු
සාමාජික - අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුව/ආයතන ප්‍රධාන ගණකාධිකාරී /ගණකාධිකාරී
සාමාජික - සහකාර ලේකම්/පරිපාලන නිලධාරී
නිරීක්ෂණ මට්ටමේ නිලධාරීන් - සහකාර විගණකාධිපති/විගණන අධිකාරී/විගණන පරීක්ෂක
–පළාත් භාණ්ඩාගාරයේ නියෝජිතයකු/නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)/අධ්‍යක්ෂ සාමාජික - අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ කාර්ය භාරය හා ව්‍යුහයන් අනුව සංවර්ධන/සැපයිම්/සේවා ආවරණය වන පරිදි නියෝජිතයන් පත් කර ගත හැක.

**2014 – 2015 වසරේ දී පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු ප්‍රමාණය.**

| | | |
|---|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශය | - | 04 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | - | 03 |
| ක්‍රීඩා අමාත්‍යාංශය | - | 02 |
| සෞඛ්‍ය අමාත්‍යාංශය | - | 03 |
| මාර්ග අමාත්‍යාංශය | - | 03 |

මේ අනුව පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල පාලන පද්ධතීන් කාර්යක්ෂමව මෙහෙයවීමට මෙම කමිටු කාර්ය භාරය සුවිශේෂී වැදගත්කමක් ලබාදෙන ලදි.

විගණන හා කළමනාකරණ කමිටුව අවම වශයෙන් කාර්තුවකට වරක්වත් පැවැත්විය යුතු අතර අවශ්‍යතාවය අනුව ඊට වඩා වැඩි අවස්ථා ප්‍රමාණයකදී වුවද පැවැත්විය හැකිය.

ඉහත කමිටු සංයුතියට අමතරව, කමිටු රැස්වීම පැවැත්වෙන අවස්ථා සඳහා සමාලෝචනයට භාජනය කරන කාරණයට අදාළ වන නිලධාරීන් සහභාගි කරවා ගත හැකිය.

සෑම කමිටු වාරයකදීම පහත කරුණු සමාලෝචනයට  භාජණය කෙරේ.

පසුගිය විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව සමාලෝචනය කිරීම. මෙහිදී සාකච්ඡාවය භාජනය කළ කරුණකට අදාළ තීරණය අවසන් වන තෙක් සමාලෝචනයට භාජනය කෙරේ. ආයතන මට්ටමේදී , තීරණයකට එළඹිය නොහැකි කරුණු දෙපාර්තමේන්තු මට්ටම , අමාත්‍යාංශ කමිටු මට්ටම කරා යොමු කෙරේ.

අභ්‍යන්තර විගණන / විමර්ශන වාර්තා සමාලෝචනය කිරීම

ඉදිරිපත් කරන ලද විගණන හා විමර්ශන වාර්තා වල සඳහන් කරුණු, පිළිතුරු සැපයිය යුතු  ආකාරයත්, දීර්ඝ වශයෙන් සමාලෝචනයට භාජනය කෙරේ.

රජයේ විගණන වාර්තා සමාලෝචනය කිරීම

රජයේ විගණනය විසින් ඉදිරිපත් කර ඇති විගණන වාර්තා සම්බන්ධයෙන් , එම වාර්තා වල සඳහන් කරුණු , පිළිතුරු සැපයීම්, පිළිතුරු සැපයිය යුතු ආකාරයන් දීර්ඝ වශයෙන් සමාලෝචනයට භාජනය කෙරේ.

රාජ්‍ය ගිණුම් කාරක සභා වාර්තා තිබේ නම් සමාලෝචනය කිරීම.

විදුලිය ,ජලය, දුරකථන සහ ඉන්ධන වියදම් සහ වෙනත් ගිවිසුම් ගත සේවා සම්බන්ධයෙන් වන වියදම් විමර්ශනය හා වියදම් අඩු කිරීමට අවශ්‍ය පියවර සම්බන්ධයෙන් සමාලෝචනය කිරීම.

විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමෙන් පසුගිය වර්ෂ වලදී දෙපාර්තමේන්තු වල සැලකිය යුතු ගැටලු ප්‍රමාණයන් නිරාකරණය කර ගැනීමට හැකි වීම හේතුවෙන් , කමිටු පැවැත්වීමේ වැදගත් කම හඳුනාගත් ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් විසින් 2015 වර්ෂයේදී කමිටු රැස්වීම් පැවැත්විම සඳහා දින ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම් නිරන්තරයෙන් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව වෙත ලැබෙමින් පැවතුණි.

- විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමෙන් පසුගිය වර්ෂ වලදී සැලකිය යුතු ගැටළු ප්‍රමාණයක් නිරාකරණය කර ගැනීමට හැකිවීම හේතුවෙන් කමිටු පැවැත්වීමේ වැදගත් කම හඳුනාගත් ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් විසින් 2015 වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට සක්‍රීය දායකත්වයක් ලබා දෙන ලදී.

- ඌව පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව වෙත පැවරෙන විගණන රාජකාරීන් මෙන්ම විශේෂ විමර්ශන රාජකාරීන්ද ප්‍රමාදයකින් තොරව ඉටු කරමින් 2015 වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු සැලකිය යුතු ප්‍රමාණයක් කැඳවීමට අභ්‍යන්තර විගණනය වෙත හැකියාව ලැබුණි.

| | අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය | කමිටු රැස්වීම් පැවැත්වූ දිනයන් | | | |
|---|---|---|---|---|---|
| 1 | අධ්‍යාපන අමාත්‍යාංශය | 2015.03.16 | 2015.07.03 | 2015.10.05 | 2015.12.29 |
| 2 | ක්‍රීඩා අමාත්‍යාංශය | | 2015.05.14 | 2015.10.29 | |
| 3 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 2015.03.26 | 2015.06.09 | 2015.09.22 | |
| 4 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 2015.04.08 | 2015.04.08 | 2015.10.21 | |
| 5 | මාර්ග අමාත්‍යාංශය | 2015.03.31 | 2015.07.14 | 2015.11.12 | |
| 6 | ආණ්ඩුකාරවර කාර්යාලය | 2015.02.19 | 2015.05.21 | 2015.08.13 | 2015.12.29 |
| 7 | සභා ලේකම් කාර්යාලය | 2015.03.03 | 2015.07.06 | | 2015.11.17 |
| 8 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 2015.03.31 | | 2015.07.28 | 2015.10.29 |
| 9 | සමූපකාර කොමිෂන් සභාව | 2015.03.17 | | | |
| 10 | නි.ප්‍ර.ලේ (පාලන) කාර්යාලය | 2015.03.03 | 2015.06.30 | 2015.08.05 | 2015.10.06 |
| 11 | නි.ප්‍ර.ලේ (පිරිස් හා පුහුණු) කාර්යාලය | 2015.01.28 | 2015.06.24 | 2015.08.05 | 2015.12.30 |
| 12 | නි.ප්‍ර.ලේ (මූල්‍ය කළමනාකරණ) කාර්යාලය | 2015.01.20 | 2015.05.06 | 2015.07.08 | |
| 13 | නි.ප්‍ර.ලේ (ඉංජිනේරු සේවා) කාර්යාලය | | 2015.05.06 | 2015.08.04 | |
| 14 | නි.ප්‍ර.ලේ (සැලසුම්) කාර්යාලය | 2015.03.09 | 2015.07.14 | 2015.08.10 | 2015.11.12 |
| 15 | ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | | 2015.05.26 | | 2015.12.16 |
| 16 | ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 2015.03.03 | 2015.06.18 | 2015.09.29 | 2015.12.15 |
| 17 | ඌව පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුව | 2015.03.11 | | 2015.08.04 | |
| 18 | ඌව පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | 2015.03.16 | | 2015.09.08 | 2015.12.18 |
| 19 | ඌව පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 2015.03.16 | 2015.07.30 | 2015.10.05 | 2015.12.29 |
| 20 | ඌව පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | | 2015.05.26 | | 2015.10.14 |
| 21 | ඌව පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව | 2015.03.17 | 2015.06.24 | | 2015.12.18 |
| 22 | ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 2015.03.03 | 2015.06.30 | | 2015.12.16 |
| 23 | ඌව පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | | 2015.07.21 | 2015.10.08 | |
| 24 | ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 2015.02.06 | | | 2015.11.19 |
| 25 | ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව | | 2015.04.02 | 2015.10.29 | 2015.11.06 |
| 26 | ඌව පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව | 2015.02.10 | 2015.05.27 | | 2015.12. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 29 | පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | | 2015.04.08 | | 2015.12.15 |
| 30 | කලාප අධ්‍යාපන කාර්යාලය - බදුල්ල | 2015.03.06 | | 2015.07.14 | |
| 31 | කලාප අධ්‍යාපන කාර්යාලය - පස්සර | | 2015.06.11 | 2015.10.01 | |
| 32 | කලාප අධ්‍යාපන කාර්යාලය - හාලිඇල | | | 2015.07.14 | |
| 33 | කලාප අධ්‍යාපන කාර්යාලය - මොණරාගල | 2015.02.12 | | | |
| 34 | කලාප අධ්‍යාපන කාර්යාලය - වැල්ලවාය | 2015.02.12 | | | 2015.11.03 |
| 35 | කලාප අධ්‍යාපන කාර්යාලය - බණ්ඩාරවෙල | 2015.03.18 | | | |
| 36 | කලාප අධ්‍යාපන කාර්යාලය - වැලිමඩ | 2015.02.18 | | 2015.09.22 | |
| 37 | කලාප අධ්‍යාපන කාර්යාලය - මහියංගනය | | 2015.06.12 | 2015.09.02 | |
| 38 | කලාප අධ්‍යාපන කාර්යාලය - මීගහකිවුල | | 2015.06.18 | | |
| 39 | මූලික රෝහල - දියතලාව | 2015.03.26 | 2015.06.11 | | 2015.11.06 |
| 40 | මූලික රෝහල - වැලිමඩ | | 2015.06.01 | 2015.09.22 | |
| 41 | මූලික රෝහල - මහියංගනය | | 2015.06.12 | 2015.09.02 | |
| 42 | මූලික රෝහල - වැල්ලවාය | 2015.02.12 | | | 2015.11.03 |
| 43 | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - බදුල්ල | 2015.03.04 | 2015.05.26 | | 2015.12.04 |
| 44 | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - මොණරාගල | 2015.02.12 | | 2015.09.02 | |
| 45 | බණ්ඩාරවෙල නගර සභාව | | 2015.06.30 | | |
| 46 | පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලය | | 2015.05.12 | | 2015.10.29 |

විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම තුළින් ඌව පළාත් සභාවට අයත් විෂයයන්ට අදාළව ඉටු වන කටයුතු සම්බන්ධයෙන් විශාල ප්‍රගතියක් අත් කර ගැනීමට හැකියාව ලැබුණි.

ඌව පළාත් සභාව සම්බන්ධයෙන් හොඳ මට්ටමේ විගණන මතයක් ලබා ගැනීමට මුලික අඩිතාලම සකස් විනි.
විවිධ වූ හේතුන් මත කාලයක් තිස්සේ පිළිතුරු ලබා නොදුන් රජයේ විගණන විමසුම් සම්බන්ධයෙන් අවධානය යොමුවීම හා පිළිතුරු ලබා දීම.

අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු හා ආයතන වල විදුලි/දුරකථන/ජලය හා ගිවිසුම්ගත සේවා සම්බන්ධයෙන් වන වියදම් පිළිබඳව අවධානයට ලක්විම හා අවම කිරීමට ක්‍රමවේදයක් සකස් වීම.

පළාත් සභා රෝහල් හා ඖෂධ ගබඩා පැවති කල් ඉකුත් වූ ඖෂධ පිළිබඳව අවධානය යොමුවීමත් , ඒවා ගබඩා වලින් ඉවත් කිරීමට කටයුතු කිරීමත් සිදුකරන ලදි.

විගණන වාර්තා නිකුත් කිරීමෙන් පසු පෙන්වා දුන් අඩුපාඩු සම්පූර්ණ කර ගැනීමේ තත්ත්වයක් දක්නට ලැබුණි. එම තත්ත්වයට උදාහරණ කිහිපයක් පහත පරිදි වේ.

# පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක, වනිතා කටයුතු හා සමාජ සුභ සාධන අමාත්‍යාංශය

ඌව පළාතේ සෞඛ්‍ය අංශය සම්බන්ධ විගණනයේදී විවිධ වූ ක්‍රමෝපායන් අනුගමනය කරමින් විගණන හා ක්ෂේත්‍ර පරීක්ෂණ කිහිපයක් පසුගිය වර්ෂයේදී අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලදී.

1. මාසික විගණන වැඩසටහන යටතේ මූලික රෝහල්,දිසා රෝහල්,මධ්‍යම බෙහෙත් ශාලාඇතුළු සෞඛ්‍ය ආයතන විගණනයන්
2. සෞඛ්‍ය අංශයේ තෝරාගත් අංශ සම්බන්ධයෙන් විශේෂ විගණනයන් 01. රෝහල් වල යටිතල පහසුකම් සම්බන්ධ විගණන පරීක්ෂණයන්
3. රෝහල් වල ආපනශාලා සම්බන්ධ විගණන පරීක්ෂණයයන්
4. රෝහල් වල ඖෂධ ගබඩා සම්බන්ධ විගණන පරීක්ෂණයන්

# උදාහරණ 01

## මූලික රෝහල් වල ඖෂධ ගබඩා පහසුකම් සැපයීම

විගණන වාර්තාවේ අංකය - අවි/28/2015/16/98

විගණන වාර්තාවේ දිනය - 2015.11.02

ඉහත විගණන වාර්තාව මඟින් ඌව පළාතේ තෝරාගත් මූලික රෝහල්, දිසා රෝහල් වලින් තෝරාගත් සෞඛ්‍ය ආයතන 07 ක ඖෂධ ගබඩා පරීක්ෂා කිරීම.

මෙහිදී ඖෂධ ගබඩා කිරීම සඳහා ඇති ඉඩකඩ වල ප්‍රමාණාත්මක භාවය

ඖෂධ හා එන්නත් වර්ග අසුරා තැබීමේ ක්‍රමවේදය

ඖෂධ එන්නත් ගබඩා කිරීම සඳහා අවශ්‍ය පාරිසරික තත්ත්වයන්, ඖෂධ ලේඛන තුලනය කිරීම

ඖෂධ හා එන්නත් බැහැර කිරීමේ ක්‍රමවේදය

ඖෂධ හා එන්නත් කල් ඉකුත් වීම



පැරණි මෘත ශරීරාගාරය අවට ඇති අබලි ශල්‍ය ද්‍රව්‍ය අවිධිමත් ලෙස ගබඩා කිරිම (මූලික රෝහල - වැලිමඩ)




[redacted] මදකම [redacted] ඖෂධ [redacted]ාව තුළ අක්‍රමවත්ම ඖෂධ
[redacted]කරාශී කර ඇත. (මූලික රෝහල - මහියංගණය)



ඖෂධ අවිධිමත් බැහැර කිරීම (දිසා රෝහල-හපුතලේ)




ඖෂධ අවිධිමත් බැහැර කිරීම
([redacted]ා රෝහල-හපුතලේ)

- ඉහත විගණන වාර්තාව කෙරෙහි සෞඛ්‍ය අංශ දැක්වූ ප්‍රමුඛ හා විශේෂ අවධානය පිළිබඳව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විශේෂයෙන්ම අගය කරමි. මෙහිදී විගණන වාර්තාව මඟින් සියලුම කරුණු සම්බන්ධයෙන් සෞඛ්‍ය අංශ ක්‍රියාත්මක වී ඇති අතර විගණන හා කළමනාකරණ කමිටු වලදීද මෙම වාර්තාව සම්බන්ධයෙන් රජයේ විගණනය සම්බන්ධ කර ගනිමින් සමලෝචනය සිදු කර ඇත. මෙහිදී,

1. ඖෂධ ලේඛනය තුලනය කිරීම හා විධිමත් පරිදි අධීක්ෂණය කිරීම සඳහා සියලුම සෞඛ්‍ය අංශ ප්‍රධානීන් දැනුවත් කිරීම.
2. ඖෂධ ගුණාත්මක ලෙස ගබඩා කිරීම සඳහා ඖෂධ ගබඩා වායුසමනය කිරීමට අවශ්‍ය මූලික පියවර ගැනීම.
3. ඖෂධ වල ගුණාත්මක භාවය, ආරක්ෂාව, තුලනය කිරීම, අසුරා තැබීම, කල්ඉකුත් වීමේ දිනය පිළිබඳව සැලකිලිමත් වීමට සෞඛ්‍ය අංශ ප්‍රධානීන්ට උපදෙස් ලබා දීම.

B/H, D/H ,R/H, C/D,.......................................................

Inspection Report of Pharmaceuticals

Inspected by Head of Institute/Pharmacist

# CHECK LIST

## Drugs Stores

| | very good | Good | Satisfactory | Unsatisfactory |
|---|---|---|---|---|
| Storage of drugs,sur;items | | | | |
| Cleaning | | | | |
| Maintanse of Refrigerators | | | | |
| Maintaining of Availability Drug list | | | | |
| Book Balancing | | | | |
| Maintaining of Expiry list | | | | |

Test Check of drugs/surgical item

| Item | Book No. | Page No. | Book.Balance | Ver.Balance | difference |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |

Out of Stock Drugs

| | |
|---|---|
| | 4 |
| | 5 |
| | 6 |

Non Moving Drugs

| | |
|---|---|
| | 4 |
| | 5 |
| | 6 |

## O.P.D.DISPENSARY

| | Very good | Good | Satisfactory | Unsatisfacto |
|---|---|---|---|---|
| Storage of drugs,sur;items | | | | |
| Cleaning | | | | |
| Maintanse of Refrigerators | | | | |
| Maintaining of Availability Drug list | | | | |
| Maintaining of Expiry list | | | | |
| Book Balancing | | | | |

Test Check of drugs/surgical Item

| Item | Book No. | Page No. | Book.Balance | Ver.Balance | difference |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |

Out of Stock Drugs

| | |
|---|---|
| | 4 |
| | 5 |
| | 6 |

Non Moving Drugs

| | |
|---|---|
| | 4 |
| | 5 |
| | 6 |

## Clinic Pharmacy

Test Check of drugs/surgical item

| Item | Book No. | Page No. | Book.Balance | Ver.Balance | difference |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |


Sig;Head of Inst;..........................................................

Date....................

උෘව පළාත් මුදල් හා ක්‍රම සම්පාදන,නීතිය හා සාමය,අධ්‍යාපන,පළාත් පාලන,විදුලිබල හා බලශක්ති,ඉදිකිරීම්,ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍යාංශය

# බ/අලුකැටියාව විද්‍යාලය - මහියංගණය
# විගණන වාර්තාවේ අංකය - අවි/13/2015/34
# දිනය - 2015.10.14

**අලුකැටියාව විද්‍යාලය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන පරීක්ෂණයක් 2015 ජුලි මාසයේ සිදුකරන ලද අතර, පාසල් භූමිය යටිතල පහසුකම් , නිල නිවාස පරීක්ෂා කිරීමේදී අවධානම් සහිත තත්ත්වයන් විගණන අංශ වෙත නිරීක්ෂණය විය. මේ පිළිබඳව විගණන වාර්තා මඟින් දැනුවත් කළ අතර, විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද විගණන වාර්තාව මඟින්ද මෙම තත්ත්වය පැහැදිලි කරන ලදී.**



# අවදානම් සහිත ගල් පර්වතය

පාසලෙහි පිහිටි විශාල ගල් පර්වතයෙන් ගැලවී ගිය විශාල ගල් කොටසක් පාසල් ගොඩනැඟිල්ලක් මතට සහ පාසල් ළමුන් නිතර ගැවසෙන ස්ථානයක් වෙත පෙරලී යාමට ආසන්නව පවතිනු විගණනයට නිරීක්ෂණය විය. මේ පිළිබඳව අදාල බලධාරීන්ගේ ක්ෂණික අවධානය යොමු වීමේ අවශ්‍යතාවය පවතින අතර, සුදුසු ක්‍රමවේද භාවිත කොට මෙම ගල ඉවත් කිරීම කඩිනමින් සිදු කළ යුතුය.






ඉහළ කළමනාකරණය මඟින් ලබා දුන් උපදෙස් මත ගල් පර්වතය ඉවත් කිරීමෙන් [redacted] ම අනාරක්ෂිත භාවය මඟහැරී ඇත.



# මො/ නමුණුකුල තැන්නේකුඹුර දෙමළ විදුහලේ වැසිකිළි ඉදි කිරීම.

විගණන වාර්තාවේ අංකය - අවි/19/2014/15/100

දිනය - 2014.10.02

- <u>ඉදිකළ වැසිකිළියේ වර්තමාන තත්ත්වය</u>

මොණරාගල කලාප අධ්‍යාපන කොට්ඨාශයට අයත් මො/ නමුණුකුල තැන්නේකුඹුර දෙමළ විදුහල අභ්‍යන්තර විගණන අංශය විසින් පරීක්ෂා කිරීමේදී පාසලේ ඉදි කර තිබූ වැසිකිළි පද්ධතියේ අවිධිමත් භාවය පිළිබඳව විගණනය අවධානය යොමු වුණි.

වැසිකිළි හතරක් එකම ගොඩනැගිල්ලක් තුළ එකිනෙක හා සම්බන්ධ වන ලෙස ඉදි කර තිබූ ආකාරයත් මිශ්‍ර පාසලක් වන මෙම පාසල සඳහා වන එකම වැසිකිළි පද්ධතිය මෙය වන බවත් ඇතුළුවීම සඳහා එක් දොරක් පමණක් සවි කර තිබෙන ආකාරයක් නිරීක්ෂණය විය.

එක් දොරකින් ඇතුළු විය හැකි වනසේ වැසිකිළි හතරක් එකම ගොඩනැගිල්ලක් තුළ එකිනෙක හා සම්බන්ධ වන ලෙස ඉදිකොට ඇති ආකාරය පහත ඡායාරූපයේ දැක්වේ.



ඒ අනුව මෙම වැසිකිළි පද්ධතිය පරීක්ෂා කිරීමේදී විගණනයට අඩුපාඩු කිහිපයක්ම නිරීක්ෂණය වී ඇත.

මෙම වැසිකිළි ඉදිකිරීමේදි ජල බැස්ම කෙරෙහි අවධානය යොමුකොට නොමැති බවත් ඒ හේතුව නිසා ජලය බැස යාමට ක්‍රමවේදයක් සකස් වී නොමැත. එසේම වැසිකිළි පෝච්චි කිහිපයක් කැඩී ඇති තත්ත්වයත් යොදා ඇති දොරවල් අවම පිරිවැයක් යොදවා සකස් කොට ඇති බව හා වැසිකිළි ටයිල් කිරීමද නිසි පරිදි ඉටුකොට නොමැති ආකාරයත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද විගණන වාර්තාව මඟින් විස්තරාත්මකව පෙන්වා දෙන ලදී.

# එම තත්ත්වයන් පහත ඡායාරූප මඟින් දැක්වේ.







ජලය බැස නොයා එකතුවී ඇති අයුරු

තවද මෙම මැසිකිළි යුගලයක අපද්‍රව්‍ය යොමු කොට තිබූ මැසිකිළි වළක් කඩා වැටී තිබෙනු නිරීක්ෂණය විය. මෙමගින් යම් අනතුරක් සිදුවීමේ අවධානමක් පැවතුණි.



විගණන වාර්තාව මඟින් පෙන්වා දීමෙන් අනතුරුව නිලධාරීන්ගේ විශේෂ අවධානය මෙම තත්ත්වයන් කෙරෙහි යොමු වී ඇත. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ පසු විපරම් ක්‍රියාවලියේදී තැන්නෙකුඹුර විදුහලේ වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය පහත පරිදිය.

සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයේදී විගණන වාර්තාව මගින් පෙන්වා දුන් සියළුම කරුණු පිළිබඳව අවධානය යොමු වී ඇති බවත් ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බවත් නිරීක්ෂණය විය.

**01** වැසිකිළි පද්ධතිය සඳහා අළුතින් අමතර දොරක් යොදා අමතර වෙන් කිරීමක් සිදු කර අවිධිමත් තත්ත්වය නිවැරදි කර ඇත.










**01.**වැසිකිළි පද්ධතියේ පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කර ඇත.

**අවධානම්කාරී වැසිකිළි වල විධිමත් ආකාරයෙන් සකස් කිරිමට පියවර ගෙන ඇත.**






පෙර තත්ත්වය

[redacted] තත්ත්වය

- **තවදුරටත් අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර**

- <u>අධ්‍යාපන අමාත්‍යාංශය</u>
- 
- <u>පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව</u>
- <u>කලාප අධ්‍යාපන කාර්යාලය</u>
- 
- ගුරු උපදේශනය, දින සටහන් හා වාර සටහන් නියමිත පරිදි ඉදිරිපත් කර ඉගැන්වීම් ක්‍රමවේදයේ පෙර සූදානම මෙන්ම පාසැල් අධීක්ෂණය සහ පුහුණු කටයුතු වල බලපෑම මත සිසු දරුවන්ගේ සාධන මට්ටම් අඩු වී ඇති මට්ටමක් නිරීක්ෂණය වේ.

- <u>2015 වසරේ අ.පො.ස ( සා.පෙළ ) විභාගය වෙත ඉදිරිපත් වූ ළමුන් අතරින් තෝරා ගත් සිසුන් 10 දෙනෙකුගේ ගණිතය/ ඉංග්‍රීසි විෂය සඳහා සාධන මට්ටම</u>
- 
- බ/ ධර්මාශෝක විදුහල - බණ්ඩාරවෙල (අවි/15/2015/01/05)
- (2014 වර්ෂය 10 ශ්‍රේණිය)

| නම | ලකුණු |
|---|---|
| ආර්.එම්. සලිඳු දිල්ශාන් | 03 |
| එස්. නවීල් | 03 |
| සුමිත්‍රා නිසංසලා | 06 |
| සචිනි ලසන්ති | 06 |
| සමීර ලක්ෂාන් | 02 |
| තරංග ලක්ෂාන් | 04 |
| අශෝක් මධුසංක | 03 |
| වී.එම්.ලක්මාලි | 06 |
| සකුණි මධුභාෂි | 05 |
| මු[illegible]ායක | 06 |

## ඉංග්‍රී[redacted] වි[redacted]කඟ විය නොහැකි අවම ලකුණු ලබා[redacted] දෙනෙකුගේ තොරතුරු

| නම | ලැබූ ලකුණු ලකුණු සංඛ්‍යාව |
|---|---|
| පසිඳු නුවන් | 16 |
| සඳුන් කුමාර | 16 |
| මධුභාෂි | 15 |
| ලක්ෂාණි | 15 |
| තරංග ලක්ෂාන් | 14 |
| ඉන්දික නුවන් | 14 |
| මධූෂිකා | 13 |
| කසුන් චාමර | 10 |
| ජයසංඛ | 10 |
| සජිත් මධුරංග | 09 |

# මො/ කෝන්ගස්පිටිය විදුහල (අවි/02/මො/2015/16)

## ගණිතය විෂය සඳහා තෝරාගත් සිසුන් 05 දෙනෙකුගේ ලකුණු ලබා ගැනීම. (2015 පළමු වාරය 11 වසර)

| නම | ලකුණු | | |
|---|---|---|---|
| | ගණිතය | විද්‍යාව | ඉංග්‍රීසි |
| පී.එම්. සංජීව | 01 | 07 | 08 |
| ඩී.එම්. ප්‍රසාද් | 01 | - | 04 |
| කේ.එම්. චින්තක | 01 | 05 | 02 |
| පුෂ්පලතා | 01 | 08 | 11 |
| මධුරානි | 01 | 18 | 24 |

**නියමිත ක්‍රමවේද මත කටයුතු කර නිසි අධීක්ෂණයක් සහිත දුෂ්කර පාසැලක අධ්‍යාපන සංවර්ධනය පහත පරිදිය.**

## බ/ අළුයටවෙල මහ විදුහල - මහියංගනය

පසුගිය වර්ෂ 05 තුළ අ.පො.ස.(සා.පෙ.) විභාගයේ ප්‍රතිඵල මත අධ්‍යාපන සංවර්ධන වර්ධනය වීමක් සිදුව ඇත.

| විෂය | සමත්වීමේ ප්‍රතිශතය (%) | | | | |
|---|---|---|---|---|---|
| | **2009** | **2010** | **2011** | **2012** | **2013** |
| සිංහල | 68 | 70 | 80 | 79 | 80 |
| ඉංග්‍රීසි | 14 | 15 | 16 | 18 | 27 |
| ගණිතය | 31 | 49 | 33 | 59 | 58 |
| විද්‍යාව | 24 | 27 | 30 | 30 | 56 |
| ඉතිහාසය | 60 | 63 | 60 | 59 | 69 |
| ගෘහ ආර්ථික විද්‍යාව | 67 | 80 | 80 | 60 | 100 |

# තවදුරටත් අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍රයන්

සෞඛ්‍ය අමාත්‍යාංශය

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල

ඩෙංගු මර්ධන ව්‍යාපෘති

# ඩෙංගු රෝගීන් වාර්තා වීම - බදුල්ල දිස්ත්‍රික්කය

| අනු අංකය | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය | 2013 වර්ෂය | | | 2014 වර්ෂය | | | 2015 වර්ෂය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රදේශගත | සංක්‍රමණ | එකතුව | ප්‍රදේශගත | සංක්‍රමණ | එකතුව | ප්‍රදේශගත | සංක්‍රමණ | එකතුව |
| 01 | බදුල්ල | 154 | - | 154 | 412 | 30 | 442 | 106 | 25 | 131 |
| 02 | බණ්ඩාරවෙල | 24 | - | 24 | 16 | 27 | 43 | 7 | 10 | 17 |
| 03 | ඇල්ල | 20 | - | 20 | 9 | 18 | 27 | - | 10 | 10 |
| 04 | ගිරාඳුරුකෝට්ටේ | 14 | - | 14 | 1 | 5 | 6 | - | 8 | 8 |
| 05 | හල්දුම්මුල්ල | 19 | - | 19 | 2 | 42 | 44 | - | 12 | 12 |
| 06 | හාලි ඇල | 59 | - | 59 | 7 | 52 | 61 | - | 25 | 25 |
| 07 | හපුතලේ | 25 | - | 25 | 2 | 60 | 62 | - | 32 | 32 |
| 08 | කන්දකැටිය | 9 | - | 9 | - | 10 | 10 | - | 9 | 9 |
| 09 | ලුනුගල | 17 | - | 17 | - | 12 | 12 | - | 5 | 5 |
| 10 | මහියංගනය | 5 | - | 5 | - | 3 | 3 | - | - | - |
| 11 | මීගහකිවුල | 9 | - | 9 | 1 | 21 | 22 | - | 11 | 11 |
| 12 | පස්සර | 32 | - | 32 | 4 | 31 | 35 | 1 | 21 | 22 |
| 13 | රිදීමාලියද්ද | 17 | - | 17 | 1 | 22 | 23 | - | 9 | 9 |
| 14 | සොරණාතොට | 24 | - | 24 | 9 | 9 | 18 | 1 | 13 | 14 |
| 15 | ඌව පරණගම | 66 | - | 66 | 1 | 34 | 35 | - | 19 | 19 |
| 16 | වැලිම[illegible] | 41 | - | 41 | 22 | 43 | 65 | 9 | 19 | 28 |
| එකතුව | | 535 | - | 535 | 487 | 419 | 906 | 124 | 228 | 352 |

# ඩෙංගු රෝග මර්ධන වැඩසටහන්

| අනු අංකය | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය | 2013 වර්ෂය | | | | 2014 වර්ෂය | | | | 2015 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මදුරුවන් බෝවිය හැකි ස්ථාන ශ්‍රමදානයකින් පිරිසිදු කිරීම | ප්‍රජාව, පාසල් ළමුන්, කාර්යාල දැනුවත් කිරීම්, දේශන, අත්පත්‍රිකා | නිවාස පරීක්ෂාව | නිවේදන සහ නීතිමය කටයුතු | මදුරුවන් බෝවිය හැකි ස්ථාන ශ්‍රමදානයකින් පිරිසිදු කිරීම | ප්‍රජාව, පාසල් ළමුන්, කාර්යාල දැනුවත් කිරීම්, දේශන, අත්පත්‍රිකා | නිවාස පරීක්ෂාව | නිවේදන සහ නීතිමය කටයුතු | මදුරුවන් බෝවිය හැකි ස්ථාන ශ්‍රමදානයකින් පිරිසිදු කිරීම | ප්‍රජාව, පාසල් ළමුන්, කාර්යාල දැනුවත් කිරීම්, දේශන, අත්පත්‍රිකා | නිවාස පරීක්ෂාව | නිවේදන සහ නීතිමය කටයුතු |
| 01 | බදුල්ල | 127 | 56936 | 11827 | 251 | 207 | 55255 | 14067 | 399 | 152 | 60301 | 19790 | 478 |
| 02 | බණ්ඩාරවෙල | 99 | 5874 | 4842 | 290 | 94 | 7061 | 4541 | 248 | 91 | 5055 | 7573 | 234 |
| 03 | ඇල්ල | 74 | 10259 | 2738 | 33 | 122 | 15859 | 2046 | 22 | 47 | 10875 | 2583 | 34 |
| 04 | ගිරාදුරුකෝට්ටේ | 49 | 20873 | 2042 | 94 | 32 | 18931 | 1625 | 131 | 37 | 13911 | 2191 | 409 |
| 05 | හල්දුම්මුල්ල | 56 | 11939 | 3812 | 140 | 52 | 8342 | 3284 | 47 | 21 | 6533 | 5339 | 67 |
| 06 | හාලි ඇල | 127 | 12377 | 4060 | 112 | 89 | 13250 | 4802 | 95 | 54 | 11667 | 7790 | 153 |
| 07 | හපුතලේ | 82 | 7039 | 2482 | 11 | 74 | 6963 | 3578 | 24 | 44 | 4017 | 5008 | 41 |
| 08 | කන්දකැටිය | 75 | 8308 | 8455 | - | 69 | 5798 | 3424 | 16 | 30 | 2414 | 3180 | - |
| 09 | ලුනුගල | 84 | 5718 | 2838 | 15 | 73 | 8537 | 2306 | 12 | 71 | 5313 | 5067 | 20 |
| 10 | මහියංගනය | 88 | 11974 | 4559 | 87 | 48 | 6826 | 2242 | 67 | 18 | 8500 | 2494 | 77 |
| 11 | මීගහකිවුල | 35 | 4011 | 1517 | 23 | 39 | 2311 | 1534 | 40 | 23 | 1045 | 1727 | 35 |
| 12 | පස්සර | 122 | 20610 | 6783 | 279 | 57 | 10370 | 4600 | 78 | 44 | 9884 | 7106 | 310 |
| 13 | රිදීමාලියද්ද | 50 | 8366 | 2423 | 27 | 31 | 5547 | 804 | 4 | 15 | 4221 | 1464 | 25 |
| 14 | සොරණාතොට | 19 | 2326 | 553 | 5 | 25 | 994 | 377 | - | 14 | 1711 | 1928 | 82 |
| 15 | ඌව පරණගම | 63 | 6097 | 5660 | 103 | 105 | 7527 | 6571 | 92 | 59 | 3897 | 5151 | 135 |
| 16 | වැලිමඩ | 53 | 18585 | 4494 | 35 | 57 | 7348 | 8122 | 86 | 40 | 7356 | 9471 | 71 |
| එකතුව | | 1203 | 211737 | 69085 | 1505 | 1174 | 180919 | 63923 | 1361 | 760 | 156492 | 87862 | 2171 |

ඩෙංගු රෝග මර්ධන වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක වීම පිළිබඳව තවදුරටත් අවධානය යොමු වීම ඉතා වැදගත් වේ. 2013 වර්ෂයට වඩා 2014 වර්ෂයේ රෝගීන් ප්‍රමානය ඉශල යාමක් සිදු වීම ඩෙංගු මර්දන වැඩසටහන් වල ක්‍රියාත්මක වීමේ අඩුපාඩුව මත සිදු වූවක් බව ඉදිරිපත් වී ඇති තොරතුරු අනුව නිරීක්ෂණය වේ. 2015 වර්ෂයේ රෝගීන් අඩුවීම තුළින් සතුටුදායක මට්ටමක් වාර්තා වී ඇති අතර එම තත්ත්වය ඉදිරියේදීද පවත්වා ගත යුතුය.

විශේෂයෙන්ම මහියංගන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ඩෙංගු මර්ධන වැඩසටහන් නිසි පරිදි ක්‍රියාත්මක වීම නිසා එම ප්‍ර දේශයේ ඩෙංගු රෝගින්ගේ වාර්තා වීම.

| | |
|---|---|
| **2013** වසරේ | **05** |
| **2014** වසරේ | **03** |
| **2015** වසරේ | **00** විම සුවිශේෂී තත්ත්වයකි. |

# කෘෂිකර්ම අමාත්‍යාංශය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

- කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථාන වල තවදුරටත් ප්‍රයෝජනයට ගෙන ආදර්ශ වගාවන් ව්‍යාප්ත කිරීමේ ඉඩකඩ පවතින බව විගණනය වෙත නිරීක්ෂණය වේ. එම මධ්‍යස්ථාන වල සිටින සේවකයින් සහ ලබා දිය හැකි පහසුකම් මත යම් අමතර ආදයමක් උපයා ගැනීමේ හැකියාවද පවතින බැවින් මේ පිළිබඳව අවධානය යොමු කළ යුතුය.

  බිදුණු වැව සේවා සංස්කරණ මධ්‍යස්ථානයේ තිබෙන ඉඩම් වලින් සැලකිය යුතු ප්‍රමාණයක් කිසිදු ප්‍රයෝජනයකට නොගන්නා තත්ත්වයක් නිරීක්ෂණය වේ.

- උදා- අවි/**19/2015/20/111** හා **2015.12.16** දරණ විගණන වාර්තාව




24 11 2015

24 11 2015

24 11 2015

24 11 2015

# බිබිල ගොවි පුහුණු මධ්‍යස්ථානය













21 01 2016


21 01 2016

# [redacted] සඳහා කෘෂි උපකරණ ලබා දීම.

භාණ්ඩ බෙදා හැරීමේ ලේඛනයට අනුව බෙදා හැර ඇති පහත සඳහන් භාණ්ඩ සම්බන්ධ ක්ෂේත්‍ර පරික්ෂාවක් සිදු කරන ලදි.

| අනු අංකය | භාණ්ඩයේ නම | ලබාදුන් අයගේ නම | නිරීක්ෂණ |
|---|---|---|---|
| 01 | විසුරුම් ජල සම්පාදන කට්ටලය | කේ.එච්.එම්. නිමල් ජයවර්ධන අංක 1317/14, බෙලන්ගොල්ල, වරාපිටිය, කෙසෙල්පොත. | මෙම උපකරණ සවිකර නොමැති අතර නිවසේ තැන්පත් කර ඇති බව නිරීක්ෂණය විය. එහි අවශ්‍යතාවය වැඩි කාල වලට නොව නියඟය පවතින කාලයට අවශ්‍ය බව හෙළි විය. |
| 02 | විසුරුම් ජල සම්පාදන කට්ටලය | ඩී.එම්. ගුණවර්ධන යාය අංක 55/32, පේරගොල්ල. | |
| 03 | දියර ඉසින යන්ත්‍රය | ආර්.එම්. දසනායක අංක 50, වෙලම්පැල. | අදාළ අයට ලැබී ඇති බව නිරීක්ෂණය විය. මෙම උපකරණ නියමාකාරයෙන් ප්‍රයෝජනයට ගන්නේද යන්න දෙපාර්තමේන්තුව මඟින් පසු විපරම් සිදු කිරීම සුදුසු වේ. |
| 04 | පැඩ් ක්ලිනර් යන්ත්‍රය (බිත්තර වී පවිත්‍ර කරන යන්ත්‍රය) | ඩී.එම්. ධර්මසේන යාය 6/144, 6/ සී 2, වෙලම්පැල ගොවි සංවිධානය, සෙනෙවිගම, නාගදීප. | අදාළ යන්ත්‍රය ලබා දී ඇතත්, බිත්තර වී අලෙවි කර ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් නොමැති බව නිරීක්ෂණය විය. එමෙන්ම බිත්තර වී නිෂ්පාදනයෙන් පසු ප්‍රමිතියකින් යුතුව අසුරා තැබීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීම සුදුසු බවද අධීක්ෂණය හා පසු විපරම් කිරීම විධිමත් විය යුතු බවද යෝජනා කරමි. |









- පසුගිය 2015 වර්ෂය තුලදී සමස්ථයක් වශයෙන් අභ්‍යන්තර විගණන කටයුතු සඳහා ප්‍රමාණවත් සහයෝගයක් පළාත් සභා සියළුම ආයතන තුලින් ලබා දුනි. විගණන වැඩසහනට ඇතුළත් කලත් විශේෂ විමර්ශන කටයුතු සඳහා නිලධාරීන් යෙදවීම මත  ආයතන කීපයක අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීමට හැකියාව නොලැබුණි. එම ආයතන 2016 වර්ෂයේ මුල් කාර්තුවේ විගණන කටයුතු සඳහා යොමු කරන බවත්  දන්වා සිටිමි.

- ඉදිරි විගණන කටුයතු සඳහා ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ සහ ඌව පළාත් ප්‍රධාන ලේකම් තුමන්ගේ මෙන්ම ඌව පළාත් ආණ්ඩුකාර ලේකම් තුමා, අමාත්‍යාංශ ලේකම් තුමන්ලාගේ/ තුමියන්ලාගේ හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් තුමන්ලාගේ/ තුමියන්ලාගේ  උපදෙස් සහ අවශ්‍ය සහය ලබා දෙන මෙන් ඉල්ලා සිටිම. මෙම සාකච්ඡාව අවසන් කරමි.

# ස්තූතියි.